**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.05 පැය 0635 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 20 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**පිස්තෝල අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.10.31 වන දින ධීවර යාත්‍රාවක් මගින් මත්ද්‍රව්‍ය තොගයක් මෙරටට රැගෙන ඒම සම්බන්ධව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හේමාල් ප්‍රසාන්ත මහතාගේ උපදෙස් මත විමර්ශන ආරම්භ කර තිබිණි.

එම විමර්ශන වලදී අනාවරණය කර ගත් තොරතුරු මත ධීවර යාත්‍රාවේ හිමිකාර සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙම සැකකරු විසින් නිවසක සඟවා තිබූ **විදේශ රටක නිෂ්පාදිත මයික්‍රෝ වර්ගයේ පිස්තෝල අවියක්, එම මැගසිනයක් සහ සජීව පතරොම් 04ක්** පොලිසිය විසින් සොයා ගෙන ඇති අතර ඔහු හට ගිනි අවිය ලබාදුන් බවට සැකකරන තවත් පුද්ගලයෙකුද හික්කඩුව ප්‍රදේශයේදී එම කාර්යංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 හා 33 යන වයස්වල පසුවන වැලිල්ලාන සහ ගින්තොට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබන අතර මෙම අත්අඩංගුවට ගත් ගිනි අවිය සම්බන්ධ වීඩියෝ පටයක් මේ සමඟ ඔබ වෙත එවමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**